THE OFFICIAL NEWSLETTER OF UVA WELLASSA UNIVERSITY OF SRI LANKA

# LEO TIMES

VOLUME 17 | EDITION 01 | JULY 2024

**THE MORE THAT YOU READ, THE MORE THINGS YOU WILL KNOW. THE MORE THAT YOU LEARN, THE MORE PLACES YOU WILL GO.**

## CELEBRATING EXCELLENCE AT RESILENCIA '24!




**RESILENCIA '24!**
» PAGE 07

**BELLA CIAO**
» PAGE 17

**ආලෝක යාත්‍රා**
» PAGE 18





LEO CLUB OF Uva Wellassa University

Leos of SriLanka & Maldives ▸INSPIRING LIVES

# CONTENTS


01 Special Notes 03

02 C2 Award Cermony 07

03 Leaders Gathering 12

04 ආශිර්වාද පුජාව 13

05 සිතිවිලි දැහැන 14

06 Roaring Events of the Lion's Heart 16

07 Bella Ciao 17

08 ආලෝක යාත්‍රා 18

09 Editorial Crew 32

10 Editer's Message 33

# MESSAGE FROM DISTRICT PRESIDENT

## *LEO DISTRICT 306 C2*



Thank you for the warm invitation and the opportunity to be a part of your club's first magazine. It was an honor to engage with such a dedicated group of individuals from the Leo Club of Uva Wellassa Univeristy. Your commitment to service and excellence to the Leo District 306 C2 and the community is truly inspiring. I am confident that with your passion and determination, the coming year will be filled with sustainable impact and success. Keep up the great work, and continue to positively impact our community. Wishing you all the very best for the New Leostic year 2024-25.

---

**Leo Lion Sunera Naveed Lokupitiya**
*MAF FLM*
*District President*
*Leo District 306 C2*

*Sunera Naveed Lokupitiya*

# MESSAGE FROM PRESIDENT OF THE LIONS CLUB OF UVA CAPITAL



Dear Leo Club Members,

As the President of our Lions Club, I extend my heartfelt gratitude to each one of you for your dedication, passion, and tireless efforts in serving our community. Your commitment to making a difference and your enthusiasm for service are truly inspiring.

Throughout this year, you have demonstrated what it means to lead with compassion and integrity. Whether through organizing fundraisers, participating in community clean-ups, or supporting local initiatives, your contributions have significantly impacted many lives. The spirit of service you embody resonates with the core values of our organization and propels us toward a brighter future.

# MESSAGE FROM **PRESIDENT OF THE LIONS CLUB OF UVA CAPITAL**



I encourage you to continue embracing opportunities for growth and leadership within our club. Each project you undertake, each challenge you overcome, and each smile you bring to someone's face is a testament to the incredible potential within you. Remember that your actions today are shaping a better tomorrow.

Together, we have the power to create lasting change. Let us continue to support one another, innovate, and inspire others to join our mission. Your energy and ideas are vital to the success of our club and the betterment of our community.

Thank you for your unwavering dedication and for being the driving force behind our collective achievements. I am proud to serve along-

---

**Lion Shashika Wemulla MAF**

*President,*
*Lions club of Uva Capital*

Shashika Wemulla

# MESSAGE FROM PRESIDENT
## *LEO CLUB OF UWU*

**Hey my dear Leo buddies,**
**I am Leo Sahan Panditharathna, the elected Leo Club President of the Leo Club of Uva Wellassa University for the Leoistic year 2024/25. I am happy to take on this role and look forward to an impactful year ahead.- Together, I hope we can do some great projects and exceed expectations, making a real difference in our community. With your support, we can achieve amazing things and make this year memorable for all of us. Let's embrace the spirit of being a "LEO" by grabbing every "Opportunity" that comes our way, gaining valuable "Experiences," and growing as great "Leaders."Cheers to UWU Leos! Let's make this year outstanding!**

---

**Leo Sahan Panditharathna**
***President Leo club of Uva wellassa University***



*Sahan Panditharathna*

# CELEBRATING EXCELLENCE AT RESILENCIA '24!

The Leo Club of Uva Wellassa University recently Participated the prestigious Resilencia'24 AWARD CEREMONY, honoring outstanding achievements within the club. The event was a remarkable celebration of dedication, hard work, and excellence. Here's a comprehensive look at the accolades received by our outstanding members

## TOP HONORS

CELEBRATING OUTSTANDING ZONE DIRECTOR

*MOST OUTSTANDING ZONE DIRECTOR*
**LEO ERANDINI AMBALAMPITIYA**
★★★★★

## FIRST RUNNERS-UP

01ST RUNNER-UP

*MOST OUTSTANDING IMMEDIATE PAST PRESIDENT*
**LEO ERANDINI AMBALAMPITIYA**
★★★★★

01ST RUNNER-UP

*MOST OUTSTANDING BULLETIN EDITOR*
**LEO ABISHEK HATHTHAKAGE**
★★★★★

01ST RUNNER-UP

*BEST PROJECT FOR PEACE, RELIGIOUS, AND CULTURAL ACTIVITIES*
**PROJECT : සොකරි නාඩගම**
★★★★★

## SECOND RUNNERS-UP

**02ND RUNNER-UP**

*MOST OUTSTANDING UNIVERSITY BASED OMEGA LEO CLUB*

★★★★★

**02ND RUNNER-UP**

*BEST PROJECT FOR YOUTH EMPOWERMENT*
**PROJECT : FORTUNE SECRET**

★★★★★

**02ND RUNNER-UP**

*BEST PROJECT FOR FELLOWSHIP*
**PROJECT : LEO'S TROPHY**

★★★★★

**02ND RUNNER-UP**

*TOP ENVIRONMENTAL PROJECT*

★★★★★

**Honoring the remarkable dedication and hard work of our Leo Club members at the Resilencia '24 AWARD CEREMONY was truly inspiring! Such a wonderful celebration of excellence.**

## APPRECIATION AWARDS

**In addition to these awards, several members were recognized for their exceptional contributions**

**CLUB ADVISOR**

*LION SHIRAZ KHAN*
★★★★★

**COUNCIL OFFICER**

*LEO ERANDINI AMBALAMPITIYA*
★★★★★

**CLUB PRESIDENT**

*LEO KIRULA PRAMOD*
★★★★★

**DEDICATED MEMBERS**

*LEO NIMESHIKA PERERA*
*LEO HANSI SHANEESHA*
★★★★★

The Leo Club of Uva Wellassa University celebrated the outstanding contributions and dedication of its members, highlighting their significant impact within and beyond the community. The club is proud of each member's achievements, which reflect the spirit and drive of the organization. Looking ahead, the club invites everyone to the Urban Adventures - Leo Youth Camp 2024 on August 3RD and 4TH, promising exciting activities and unforgettable memories.Congratulations to all for an excellent Leoistic year 23/24!




1ST RUNNER UP
LEO CLUB OF
UVA WELLASSA UNIVERSITY
OF SRI LANKA
LEO


PRESIDENT'S




2ND RUNNER UP
LEO CLUB OF
UVA WELLASSA UNIVERSITY
OF SRI LANKA
LEO
LIONS CLUBS INTERNATIONAL
DISTRICT 306 C2
SRI LANKA


2ND RUNNER UP
SERVITE VEL RELINQUO
LEO CLUB OF
UVA WELLASSA UNIVERSITY
OF SRI LANKA
LEO
LIONS CLUBS INTERNATIONAL
DISTRICT 306 C2
SRI LANKA

# LEADERS GATHERING

## Leaders Gathering Inaugurates New Leostic Year

On July 6, 2024, Leo District 306 C2 marked the beginning of the new Leostic year with the Leaders Gathering, an event held at Carey College, Colombo. This gathering was a significant occasion, bringing together district officers to reaffirm their shared commitment to leadership, service, and community growth.

Hosted by Leo District 306 C2, the gathering set the tone for the upcoming year, highlighting the importance of collaboration, dedication, and collective leadership within the Leo movement. Officers from across the district participated, with their presence serving as a testament to their unwavering dedication to the values of leadership and service that define the Leo Club's mission.

The event featured various discussions and planning sessions aimed at setting goals for the new Leostic year. It provided an excellent opportunity for leaders to network, share ideas, and discuss the strategic direction of their respective clubs.

As the new Leostic year begins, the spirit of leadership and commitment embodied in the Leaders Gathering promises to inspire positive change and growth across the district.




# ආශිර්වාද පූජාව



# Starting the Leoistic Year with Blessings

C2 Leos have commenced their Leoistic year with blessings at various significant locations. Highlighting the event at Bandarawela St. Anthony's Church, the Uva Wellassa University Leos took part in a special ceremony, receiving blessings for the year ahead. This event underscored the university's commitment to fostering growth, service, and unity within the Leo community.

Similar ceremonies took place at Kalaniya Raja Maha Viharaya and Rathnapura Saman Dewalaya, each featuring unique traditional rituals and prayers. These events emphasize the dedication of Leos to their communities and spiritual well-being.




සිතුවිලි දැහැන
සිත නිවන මංසල

# ලක් දෙරණ පිබිදූ පොසොන් සඳ

ගස් ගල් සොයා ගොස්
වැඳ මහත් හරසරින්...
උන් සතට පිහිට වනු වස්,
මිහිඳු හිමි වඩිති කරුණා සිතින්...

නිවා ලොව ඝනදුර
බුදු හිමි දෙසූ බුදු බණ,
රැගෙන විත් මෙ දෙරණ
පහන් කරවිය මනු සතුනගේ නැණ.....

පොසොන් සඳ අහස මත බලද්දී...
මිස්සක පව්ව මත දිලුනි නව සඳක්,
තිස්ස රජු එතැන් සිට ලක් දෙරණ තුල
ගෙන ගියේ දම් මගක්...

මල් පිපි හිනාහුනි...
දම් සුවඳ පැතිරුනි...
කෙලෙස් මල් පිරුණු සිත්,
දම් රසින් නැහැවුනි...

අපමණ දුක් දරා සමසිතින්...
ලෝ සතුන් රැගෙන යති ජීවිතය දෝතින්...
බුදු මග, බුදු දහම අසා දැක තුටු වෙමින්...
නිවී සැනසේවා මනු සතුන්...



Leo Shalika
Dulanjani
**Export Agriculture**
**Degree Program**




ROARING
EVENTS OF THE
LION'S HEART




# EMBRACING FRIENDSHIP AND UNITY DIGITALLY at Uva Wellassa University

In an age where virtual interactions have become increasingly common, the Leo Club of Uva Wellassa University recently organised the event "Bella Ciao" to demonstrate their adaptability to modern technology. This innovative approach not only showcased the club's proficiency in navigating virtual spaces but also emphasised the ability of online events to overcome challenges and promote fellowship among students.

As we celebrate Friendship Day, it is important to acknowledge the transformative impact of online platforms on traditional gatherings. Virtual events have created a unique space for individuals from diverse backgrounds to connect despite physical barriers. Through interactive sessions and engaging activities curated by the Leo Club members, participants were able to forge meaningful connections – sharing laughter, stories, and experiences that transcended the confines of digital screens.

Exploring this digital landscape facilitated seamless communication among current members who share a passion for community service and leadership.

Moreover, it provided a gateway for prospective members seeking to join a supportive network committed to driving positive change in society while fostering enduring friendships.

The success of "Bella Ciao" underscores the strength of friendship and unity in bridging geographical and cultural divides. By leveraging virtual platforms, the Leo Club has demonstrated its dedication to building connections and embracing technological advancements in the modern era. This event not only celebrated friendship but also highlighted the potential of online interactions to inspire collaboration, connection, and community engagement among students at Uva Wellassa University.

# ආලෝක යාත්‍රා

## අන්තර් විශ්වවිද්‍යාලයීය ඩිජිටල් පොසොන් තරගාවලිය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය ලියෝ සමාජය විසින් සංවිධානය කරනු ලැබූ අන්තර් විශ්වවිද්‍යාලයීය ඩිජිටල් පොසොන් තරගාවලිය අති සාර්ථක ලෙස නිම විය. විවිධ තරග අංශයන්ගෙන් යුත් මෙම තරගාවලිය, අපගේ නිර්මාණශීලී සහභාගීත්වයෙන් උසුලනු ලැබීය.

පොසොන් පුර පසළොස්වක පොහොය දිනයට සමගාමීව පැවැති මෙම තරගාවලිය, විවිධ විශ්වවිද්‍යාල වල සිසුන්ගේ නිර්මාණ පරිකල්පනා අභිවර්ධනය කිරීමට හැකි වූ එක් අසිරියක් ලෙස සැලකිය හැකිය.

අපේ සමාජයේ නිර්මාණශීලී පුද්ගලයන්ගේ සහභාගීත්වය, මෙම තරගාවලියේ වටිනාකම වඩාත් වැඩි කළ අතර, ඔවුන්ගේ උනන්දුව සහ කැපවීම නිසා තරගාවලියේ විශිෂ්ටත්වය තහවුරු කිරීමට හාකි විය.

මීට අමතරව, තරගාවලියේ සහභාගී වූ සියලුම අය වෙත අපගේ ගෞරවනීය සහ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර ඔබ සැමගේ නිර්මාණ සහභාගීත්වය, මෙම තරගාවලියට විශිෂ්ටත්වයක් ලබාදුනි. මෙම තරගාවලියේ සාර්ථකත්වය හේතුකොටගෙන, අප සමාජය විසින් තවත් නව නිර්මාණශීලී වැඩසටහන් හා තරග සංවිධානය කිරීමට බලාපොරොත්තු වන අතර, ඔබ සැමගේ සහභාගීත්වය අපි ඉදිරියටත් අපේක්ෂා කරන්නෙමු.



# පොසොන් උදාවෙන් දියතේ ජය දද නැගුණා

පොසොන් සඳේ සඳකිරණින් මුළු ලොව    නහවා
අනුමුදු හිමි සිරිලක් බිම පුද සසුනක්    කළා
තිස්ස තිස්ස පෑතිස් නරනිඳු මවිත    කළා
මිහිඳුතලාවේ දම් අමා රැස් ගලා    ගියා

අවිදු අඳුර පලවා හැර නුවණෑස    පුබුදා
මිහිඳු සමිඳු දෙසු දහමින් ලොව එකතු    වුණා
වැවයි දාගැබයි එක්වී  ගමක් සරු    වුණා
සමාධි අවුකනා පිළිමයෙන් මෙත් ගුණ    ගැලුවා

අපේකමයි එකමුතුවයි හදවත්    බැඳුණා
කලා ලොවේ රස මුසුකර හැමටම    බෙදුවා
කෙලෙස් මලින් පිරි සත්වග නිවනින්    සනසා
මිහිඳු සමිඳු ලක්දෙරණට නව පණ    දුන්නා

දම්රැස් මුළු ලොව පැතිරී එළිය    පැතිරුණා
මෙත් සදහම් සිතුවිල්ලෙන් හදවත්    පිරුණා
පැන්  ඉහිරුණු සුවඳ මලින් සිල් ගුණ    නැගුණා
මිහිඳු සමිඳු පහස ලැබී සසුන    බැබලුණා

රන් බෝපත් සිලි සිලිගා සුළඟෙ    නැලවුණා
වෙහෙර මළුව, දාගැබ බොදු දනගෙන්    වැසුණා
ලක් ඉතිහාසය රන් අකුරින්ම    ලියැවුණා
පොසොන් උදාවෙන් දියතේ ජය දද    නැගුණා



Leo Kithmi Manodya
**Industrial Information Technology Degree Program**

# පොසොන් පොහොය



මිහිඳු හිමිගේ ආගමනය පිළිබඳ සිහිවන විට දී
දේවානම්පියතිස් නම සිහිවනු ඇත තව මෙහි දී
ලංකා සම්බුදු සසුනේ ආරම්භය විය එහි දී
පොසොන් පොහොය සමරමු සිහිකර මේ පැහැ දී

දෙවියන් හට සමචිත් පරියාය දෙසූයෙ මිහිඳු හිමි
චුල්ලහත්ථි පදෝපමෙන් පෑතිස් රජු දහමේ නැමී
පැවිදි වුනේ භණ්ඩුක නම් කුමරු දහම් වැස්සෙ තෙමී
මෙවන් උතුම් දෑ සිදුවිණි පොසොන් සුළඟ දසත නැමී

සිරි ලංකා ද්වීපය හට බුද්ධාගම ලැබුණ දිනේ
වැදගත් වෙයි ලක්වාසී බෞද්ධයන් හට මෙදිනේ
අධ්‍යාපන, සංස්කෘතික, සමාජීය සිප් ලැබුණේ
පොසොන් පොහෝ දිනක නිසයි හැම බොදු හද සනසන්නේ

පොසොන් කූඩු, විදුලි බුබුළු බෞද්ධ කොඩි වැල් ලෙල දේ
පිංකම් පෙරහර කරවයි සැදැහැ සිතින් පේළි සැදේ
දන්සැල් වැනි ආමිස, ප්‍රතිපත්ති පූජා සැම සිත් දේ
ගණඳුර දුරලයි දසතම පැයූ විට පොසොන් සඳේ

ලියැවී ඇත ග්‍රන්ථ පවා මිහිඳු හිමිගේ ගුණ වයනා
කිත්සිරිමෙවන් රජු කරවිය මිහිඳු පෙරහරක් සොමිනා
එය සිරිලක ප්‍රථම මිහිඳු පෙරහර විය නම් දරනා
මිහිඳු හිමිගේ ගුණ ගයමින් පොසොන් පොහොය සමරමිනා



Leo Randini
Samaradiwakara
**Tea Technology
and Value Addition
Degree Program**

# පොසොන් කුසලු

පුන් සඳක් පායාපු පලියට
අපේ උන් පන්සලක් හෙව්වා
මල් පහන් ගෙන වැන්ද පළියට
කුසල් පිං බල එන්නේ නැතුවා
බැඳෙන තරමට ඇලෙන් අපේ සිත
ගලව ගන්නට තවම බැරුවා
වැඩිය නං අද මිහිඳු මා හිමි
අනේ මට මොහොතකට සිතුණා

පොසොන් රෑ පායාපු පුන්සඳ
අහසේ මිස්සක පායා තිබුණා
පව පිනක් හරියකට නොදැනුවත්
රටට බුදු ගුණ සුවඳ හැමුවා
රජෙක් ගෙන දුනු මුගුරු ඊතල
මුවෙක් පසුපස මසට දිව්වා
බුදු සමිඳු පැවසෙව්ව දහමක්
ජාතියකින් දුක් ගින්න නිව්වා


බුදු සමිඳු පය තිබ්බ දේසෙක
ශේෂ ගුණ අඩු නැතුව තිබ්බා
පව්ව පාමුල මිස්සකේ අඹ
දඹදිවෙන් බට පුවත කිව්වා
සසරේ අනියත භව දුකට තතු
අපි තුළම අපි උපද ගත්තා
මිහිඳු සමිඳුන් දෙසුව ධර්මෙන්
නිවන අපහට ඈත නැතුවා

චුල්ල  පදෝපම බණ
රජෙකුගේ නුහුගුණය  බින්දා
ගස් ගලුත් වන සතා වැඳි උන්
උතුම් බුදු බණ වැළඳ ගත්තා
එකින් එක ඉදිවෙච්ච පින්බිම්
අපේ තතු මුළු ලොවට කිව්වා
දෙවන පෑතිස් සමය සිරිලක
නවමු ලෙසකට පිබිද්දෙව්වා

වසර දෙදහස් හයසියයක් වෙයි
මිහිඳු හිමි සිරිලකට වැඩලා
බුදු සමිඳු දෙසූ ධර්මයේ තතු
ඉඳහිටක ඈත වෙනස් වීලා
මිහිඳු හිමි ගෙන ආව ධර්මය
තිබ්බනං ඒ ලෙසම රැකිලා
නමුණුකුළ සඳ එළිය නොදැකම
හිමියනේ මම නිවන් දැකලා

# පොසොන් සිසිල

මිහින්තලාව බුදුරැස් වැටිලා
සිරිලක් දීපය එළිය වෙලා......
හමනා මඳනල ගයනා බුදු ගුණ
හදවත් සිසිලෙන් සිසිල් කලා..
බෝ පත් සිලි සිලි නාදෙට සැලෙමින්
මිහිඳු හිමිට වියනක් බඳිනා...
තිස්ස නිරිඳුගේ සාධුකාරයෙන්
දම් දීපය පිළිරැව් නැගෙනා...
පුළුන් වළා මැද දිලෙන සුපුන් සඳ
ඉස්සර බුදු ගුණ මතක් කලා...
පිං සිතුවිලි මැද දිවිගෙවුලක් දන
පන් දහසක් කල් සුරකින්නා...



Leo Vishani Victor
**Hospitality, Tourism and Events Management Degree Program**

ඔන්න එකෝමත් කාලෙක සිටියා නිරිඳුන් දෙදෙනෙක්
යාළුකමේ ප්‍රතිඵල ලෙස ලැබුණා සදහම් පඬුරක්
තිස්ස තිස්ස කියා එදා ඇසුවා එක් අඹ පැනයක්
කර නැවතුණි ලංකාවම පින්වත් සම්බුද්ධ රටක්

අනුබුදු ලෙස නාම ලැබූ මිහිඳු හිමිගෙ ධර්මය ගැන
පැහැදුනු වැසියන් අදටත් වදිති මිහින්තල පුදබිම
පොසොන් සඳේ සඳ එළියේ සිරි සදහම් රැව් පිළි දෙන
සාදු නදින් ඉතිරී යයි අපගේ පින්වත් ලක්බිම

එරට මෙරට සිත් දිනමින් දන්සල් දෙන ලක් වැසියන්
පොසොන් දවස කරති තවත් පින්වත් අගනා දවසක්
බැලුබැලූ තැන කලඑළි කර සිරිලක සරසන වැසියන්
උතුම් දවස කරති තවත් අමකක නොවනා දිනයක්

අනුරපුරයි නුවර වැවයි ස්වර්ණමාලි සෑ රඳුනුයි
අටදාගෙයි වටදාගෙයි මිහින්තලා පර්වතයයි
සාදු නදයි සුගන්ධයයි දසතම පැතිරෙන සුළඟයි
කරයි මනස සන්සුන් දැන් දකින විටදී ඔබෙයි මගෙයි

ලෝක සැපය පස්සෙ දුවන මෙරටේ වැසියන් දැක්කම
හොල්මන් මන්දිර සමඟින් ස්පීකර් සෑම තැනම
බයික් රේස් යති තරැණයො පදිමින් වේගනේ උපරිම
පොසොන් දිනයෙ නියම අරුත පොසොන් දිනයෙ නියම අරුත

# පොසොන් උදාවයි දහම් අමාවයි




Kalpani Madushani
University of Kelaniya



# සිල්ගත් මහා පොසොන්

මුවෙකු ලෙසින් දෙවියෙකු කැලයට වැදුණි
කැලයේ දඩයමේ යන නිරිඳුට සිටිණි
තිස්ස නිරිඳු මුව පසුපස දිව ඇඳුණි
මිහින්තලය ළඟ පැටවා මඟ හැරුණි

තිස්ස කියා නම කියනා හඬ ඇසුණා
නිරිඳා මහත් පුදුමෙන් ඒ දෙස හැරුණා
ගල්තලාව උඩ ඉහළින් රැස් විදුණා
රන්වන් පැහැති සඟ ගණයා නෙත ගැටුනා

ඔබ කවුරුන්ද මෙහි කුමක්ද කරන්නේ
මාගේ රට ඔබ වැනි අය දැක නැහැනේ
මොනයම් අයුරු දහමක්දැයි දෙසන්නේ
නිරිඳා කුතුහලෙන් මේ හැම විමසන්නේ

මා මහින්ද වෙන්නේ මේ මාගේ පිරිවරය
දඹදිව සිට අපලක්දිව පැමිණීය
උතුම් නිමල පරම සත්‍යය අප සතුය
එයද රැගෙන ඔබලා පිණිස මෙහි වැඩිය

මිහිඳු හිමිඳු දෙසුවා ඒ ආකාරයෙන්
පැනයක් අසා රජ නුවණැස විමසීමෙන්
උතුම් සත්දහම මේ ළක පැතිරීමෙන්
පොසොන් පොහොය සිහිපත් වේ මේ අයුරින්

# පොසොන් ශ්‍රද්ධා



ඉත්තිය උත්තිය සම්බල හා බද්ධසාල
භණ්ඩුක හා සුමන යන මේ පිරිස
ධර්මදූත සේවාවේ මූලික කර
පිටමං කළා අශෝක රජු තම පුත සමග

තිස්ස රජිඳු මුව දඩයම ගිය දවස
මිහින්තලා ගල බෑබලිණී සතර දිග
"තිස්ස! තිස්ස!" යනුවෙන් ඇමතූ ස්වරය
පැතිර ගියා මුළු වනයම සතර කොන

තිස්ස රජිඳු චකිතයකට පත් වීය
ගල මුදුනේ දීප්තියක් දුටු වේය
ඊතලයයි හී යයි පසෙකට විසි වීය
තිස්ස රජිඳු "සාදු! සාදු! "නද දීය

මිහිඳු හිමිට කුතුහලයක් ඇති විය
රජුගෙන් පළමුව අඹ පැනයක් විමසීය
රජුගේ ඥාණය හිමි හට වැටහීය
පැමිණි පිරිස තිස්ස රජුට ධර්මය වදාළෝය

අනුබුදු මිහිඳු මහරහතන් වැඩි එදින
බුදු දහමින් පෝෂිත විය ජම්බුද්වීපයම
සිහිකරමින් එදවස බැතියෙන් එදාසිට
නමදිමි පොසොන් පොහොය ශ්‍රද්ධා කොට



Kawindiya Sankalapana
**Export Agriculture Degree Program**

# තිබේද නිර්මල වූ බුදුදහම අපේ ලක්රටේ

විනෝද වන්නට වනයට ගිය තිස්ස රජුන්
දුටු මුව දෙන පසුපස දිව ගිය තිස්ස රජුන්
හති වැටුන ද පය පැටලුන ද දිව ගිය තිස්ස රජුන්
ඇසුණු විට තම නාමය මුව දෙන මග හැරැන තිස්ස රජුන්

තිස්ස තිස්ස යන්න අඩගසමින් ඇසෙන හඬත්
මින් පෙර නොඇසූ ඇරයුම කාගේන් ද යන්නත්
සිතමින් හඬ ආ දෙස සොයමින් ගියමුත්
මිස්සක පව්ව අබියස නැවතුනි දණ ගසමින් කියත්

තැඹිලි වස්ත්‍ර වලින් සැරසුණු සය දෙනෙකුත් පිලිවෙලින්
සුදු වස්ත්‍රයෙනුත් සැරසුණු තවත් අයෙකු අවසානයේන්
අඹ ගස් නමින් නුවණ විමසූ මිහිදු හිමියන්
වැඩිය වගයි ලක්දිවට පොසොන් පොහොය නමින්

මහින්දාගමනයෙන් වසර ගණනාවක් ගිය පසුත්
පොසොන් පොහොය දින පිළිවෙත් සමරව් අප සැමත්
නමුදු දිනකට පමනක් සීමා වූ පිළිවෙත් පිරීමත්
තිබේද බුදු දහමෙහි කොහිම හෝ තැනකත්

මා පිය ගුණ දම් නොදන මහලු නිවාස බිහිවන ලක්රටේ
අකාරැණික හදවතුන් ලෙස දරැවන්ට සලකන ලක්රටේ
දහස් ගනින් සතුන් මරා පොලෝ රස උරා ලක්රටේ
තිබේද නිර්මල වූ බුදුදහම තවමත් අපේ ලක්රටේ



Windya Madushani
**University of Sri Jayewardenepura**

# අරුත් වැහෝන පොසොන් අසිරිය



සත් සිත් නිවා රැව් නැගෙයි ධර්ම මාත්‍රා
පුරසඳ පොසොන් දා මැවෙයි අහසේ චිත්‍රා
ලක් දෙරණ තෙමූ සේක අනුබුද්ධ නේත්‍රා
ලැබ දී නිවන් මඟට ආලෝක යාත්‍රා

කෙලෙස් බර දනන් හට තමෝ තම පරායන
දහම ලැබූ දින අදයි තම ජෝති පරායන
එයම වෙයි දිව ඔසුව බව දුක්ඛ නිවාරන
වි ගමු සසුන් එළිය අමා නිවන යන

ෂඩ් වර්ණ සැදි තොරණ දෙනෙත් ඇර බැලුවාට
නැහැ පළක් එහි අරුත දකින ඇස නැතිදාට
සිල් සමාහිත ගුණය සිතට එක් කළ දාට
ප්‍රඥා පහන් එළිය වැඩෙයි සැක මොනවාට

# අරුත් වැහේන පොසොන් අසිරිය



සිහි කරත් අනු බුද්ධ ගුණ මහිම තේජා
ශ්‍රද්ධාදී ගුණ වඩන ආමිසය පූජා
විඳගන්න ප්‍රඥාවේ ආලෝක ඕජා
සැනසෙමුද මාවතේ ප්‍රතිපත්ති පූජා

මිහිඳු හිමි බල නිසයි ලක් සසුන දිලෙන්නේ
සසුන බල නිසාමයි දහම රජ කරන්නේ
පොසොන් දින වටිනකම් දහමෙනුය රැකෙන්නේ
සිත් වඩා ගුණ පුරමු සැම නිවන් දකින්නේ

# මහින්ද්‍රාගමනය

ශ්‍රී ලංකාවට අනන්‍ය බෞද්ධ සංස්කෘතියක් ලක්දිව තුළ ආරම්භ වූයේ මහින්දාගමනයත් සමඟිනි. එතෙක් නිශ්චිත දර්ශනයක් නො ඇදහූ ලංකාවාසීන් ගුණදහමින් හා බණ දහමින් ජාතියක් ලෙස සංවර්ධනය කළ මෙම ජාතික ආගමික විප්ලවය සිහිපත් කිරීමට පොසොන් පොහොය සමරනු ලබයි.

ඉන්දියාවේ පැවැත්වූ තෙවන ධර්මසංඝායනාවෙන් පසුව සම්බුද්ධ ධර්මය ලොව පුරා බෙදා දීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සම්බුද්ධ පරිනිර්වාණයෙන් (236) වන පොසොන් පුර පසළොස්වක පොහෝදා මිහිඳු මහරහතන් වහන්සේ ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්ධසාල මහරහත් වහන්සේලාද සුමන සාමණේරයන් වහන්සේ ද භණ්ඩුක උපාසකතුමන් ද සමඟ ලංකාද්වීපයට වැඩම කරන ලදී. එකල රජු වූ දේවානම්පියතිස්ස රජු මිහිඳු මහරහතන් වහන්සේ දෙසූ චුල්ලහත්ථිපදෝපම සූත්‍රය අසා බෞද්ධ ආගම වැළඳ ගැනීමත් සමඟ බුදු දහම රාජ්‍ය ආගම බවට පත්විය. නිවැරදි දර්ශනයක් ලෙස බෞද්ධ ආගමට අමතරව ශ්‍රී ලාංකේය භික්ෂු , භික්ෂුණී පරපුරක් අට්ඨකථා සහිත ත්‍රිපිටකයක් සහ සර්වඥ ධාතූන් ද අපට ලැබුණේ මහින්දාගමනයත් සමඟිනි.

මහින්දාගමනයෙන් අනතුරුව විහාරස්ථානය කේන්ද්‍ර කොටගත් බෞද්ධ සමාජයක් වලට තුළ බිහිවිය. එමෙන්ම නිරතුරුව ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය තුළින් තම ජීවිතය සාර්ථක කර ගැනීමට ශ්‍රී ලාංකීය ජනතාව හුරුවිය. ඔවුන් තම ජීවිතයේ සුවිශේෂී කටයුතු සඳහා මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබාගැනීමට යොමු වූ අතර එමඟින් එම කටයුතු සාර්ථක වන බවට විශ්වාසයක්ද ශ්‍රී ලාංකීය බෞද්ධවාසීන් තුළ ඇතිවිය. මළවුන් ඇදහීමට පුරුදුව සිටි ජනයා ඒ වෙනුවට මළවුන්ට පින්දීමටත් , දෙවියන්ට පුද පූජා පැවැත්වූ ජනයා ඒ වෙනුවට දෙවියන්ට පින් අනුමෝදන් කිරීමටත් යොමු විය.



Leo Uwindi
Vidurangi
**Export Agriculture**
**Degree Program**





# මහින්දාගමනයත්

## සමඟ ඉන්දීය සභ්‍යත්වය ලංකාවේ මුල්බැස ගත්තාද?

ලක්දිව බුදු දහමින් නහවා මිනිස් සිත් සතන් සනසාලූ උතුම් පොසොන් පොහොයත් සමඟ අප මනසෙහි ඇඳෙනුයේ මහින්දාගමනය පිළිබඳ සිතුවමකි. නමුදු ඒ සමඟ බැඳී ඇති කාලයේ වැලි තලාවෙන් වැසී, අපට මඟහැරී ගිය ඓතිහාසික පසුබිම ද විමසා බැලීම අගනේ යැයි සිතමි.

අධිරාජ්‍ය සිහිනය යථාර්ථයක් කරගැනීමේ අරමුණ පෙරදැරි කරගනිමින් දිග් විජය ප්‍රතිපත්තිය ව්‍යාප්ත කළ අශෝක අධිරජු එය නවතා දැමූයේ කාලිංගය ආක්‍රමණයේ දී දහස් ගණන් මිනිසුන් ඔහු අතින් මියගිය සිටි අයුරු දැක කනස්සල්ලට පත්වීමෙනි. අනතුරුව දිග්විජය ප්‍රතිපත්තිය අතහැරී චණ්ඩාශෝක අධිරජු දහම් අසා තෙරුවන් සරණ ගිය සැදැහැති උපාසකයකු විය.

නිමල බුදු දහම සුරැකීම අරමුණු කරගනිමින් තෙවන ධර්ම සංගායනාව පවත්වා ජම්බුද්වීපය අසල ප්‍රත්‍යන්ත රාජ්‍යයන් සඳහා ධර්ම ප්‍රචාරය කොට නවරට සසුන් පිහිටුවීය. මෙලෙස දහම් පැතිර වූ රාජ්‍යයන් අතර අප ලංකාදීපය ද ප්‍රමුඛ විය.

අශෝක අධිරජු තිස්ස රජු සමග දිගු කාලීන මිත්‍ර සබඳකම් පැවැත්වූ බැවින් තිස්ස රජු අභිසෙස් වූ දින පහළ වූ වටිනා මහාර්ඝ වස්තූන් දූත කණ්ඩායමක් අත තම මිතුරු අධිරජුට යැවූ බව මහාවංසයේ සඳහන් වේ. කිහිප මසක් ජම්බුද්වීපයේ කල්ගත කළ මොවුන් නැවත ලක්දිව බලා ආයේ අශෝක අධිරජු ලබා දුන් රාජ කකුද භාණ්ඩත්, දහම් පණිවිඩයකුත් අතැතිවය මේ පිළිබඳව සවිස්තරාත්මකව මහාවංශ කතුවරයා සඳහන් කොට ඇත.

අශෝක රජුගේ ඉල්ලීම් පරිදි තිස්ස රජු එම රාජ කකුද භාණ්ඩ සහිතව අභිසෙස් වී දේවානම්පියතිස්ස ලෙස කිරුළු පැළඳී ය. අශෝක රජු දූත කණ්ඩායමට ලබා දුන් උපදෙස් හා තනතුරු මත රාජ්‍ය පාලන තන්ත්‍රය ද සකස් කළේය. ඒ අනුව මෙම දූතයන් සඳහා ඉන්දීය පරිපාලනය පිළිබඳ දැනුමක් අශෝක අධිරජු ලබාදුන් බව සිතිය හැක. එමගින් සිදුවූයේ ඉන්දීය පරිපාලන තන්ත්‍රය හා සභ්‍යත්වය මෙරට මුල් බැස ගැනීම යැයි සිතේ. මහින්දාගමනය මඟින් ලක්දිවට ඉන්දීය කලා ආභාසය, සමාජීය පෝෂණය ලැබිණි.එනිසාවෙන් ලාංකීය සභ්‍යත්වය ඉන්දීය සභ්‍යත්වයට අනුව හැඩගැසීමට මහින්දාගමනය මඟින් බලපෑම් එල්ල කලා විය නොහැකිද?

කෙසේ හෝ, ලාංකීය සභ්‍යත්වය බුදු දහමෙන් සුපෝෂිත වී සදාචාරවත් ප්‍රෞඪ සභ්‍යත්වයක් බිහිවීමට අඩිතාලම දැමූයේ මහින්දාගමනය බව අපට අමතක කළ නොහැක.



# පොසොන් පොහොයේ වැදගත්කම

මිහිඳු මහරහතන් වහන්සේ ලංකාද්වීපයට වැඩම කිරීමත්, ශ්‍රී ලංකාවේ සම්මා සම්බුද්ධ ශාසනය පිහිටුවීමත්, මිහිඳු මහරහතන් වහන්සේ විසින් දෙවියන් අරභයා "සමචිත්ත පරියාය" සූත්‍රය දේශනා කිරීමත්, දේවානම්පියතිස්ස රජු ඇතුළු හතළිස් දහසක් පිරිසට චුල්ලහත්තිපදෝපම සූත්‍රයෙන් ධර්මය දේශනා කිරීමත්, භණ්ඩුක කුමරු පැවිදි කර උපසම්පදා කරවීමත් යන උතුම් සිදුවීම් නිසාම ලක්වාසී න් සැදැහැවතුන්ට පොසොන් පොහොයුරින් වැදගත් වෙයි.

එමෙන්ම බුදුවී සිවුවන සතියෙහි රුවන්ගෙයි වැඩ හිඳිමින් ධර්මය මෙනෙහි කරන අප ලොව්තුරා බුදුපියාණන් වහන්සේගේ ශරීරයෙන් ප්‍රථම වරට සවනක් ගණ බුදු රැස් විහිදීමද සිදු වූයේ උතුම් පොසොන් පුන් පොහොය දිනක බව ශාසන ඉතිහාසයෙහි සඳහන්වේ. එසේම මෙරට ආගම, සංස්කෘතිය, කලාව, සමාජ සාරධර්ම අතින් මෙන්ම ථෙරවාදී බුදු දහමේ කේන්ද්‍රස්ථානයක් කරලීමටද මහින්දාගමනය ඉවහල් වූ බව ශාසන ඉතිහාසය සාක්ෂි දරයි.

නියම වශයෙන්ම ලංකාවේ බුදු සසුන අපි පිහිටවනු ලැබූයේ මිහිඳු මාහිමියන්ගේ ලංකාවතරණයෙන් පසුවය. එහෙත් බුදුරජාණන් වහන්සේ ගැනත් උන්වහන්සේගේ ධර්මය ගැනත් ඊට පෙර සිටම ජනයා දැන සිටි බවට සාධක ලංකාවේ වංශකතාවන්ගෙන් සොයාගත හැක. දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකාව යන පාලි ග්‍රන්ථයන්හි බුදුරදුන් තෙවරක්ම දිවයිනට වැඩම කළ බව සවිස්තරාත්මකව දැක්වේ.
කෙසේ නමුත් පොසොන් පොහොය දින සිදු වූ මිහිඳු මාහිමිගේ ලංකාගමනයෙන් අනතුරුව ලාංකීය හදවත් ස්පර්ශ කළ කරුණු කිහිපයකි. යහපත් සමාජයක වෙසෙන ආගම , සංස්කෘතිය සහ කලාව අවබෝධ කරගත් සාරධර්ම තුළින් ජීවිතය ගොඩනගා ගන්නා පුද්ගලයා හුදෙක් දහමට හිතැති අයෙකු ලෙස හැඳින්විය හැක. මොනයම් හෝ ආගමක ශාස්තෲවරයාණන් ඉගැන්වූ මග යන්නා පුද්ගලයා සැබෑවටම සිය ආගමට සංස්කෘතියට ආදරය කරයි.

මහින්දාගමනයෙන් ලද දායාද සියල්ලම රැක ගනිමින් යහපත් සංස්කෘතික රටක් නිර්මාණය කිරීමට දායක වීම සැබෑ ලාංකිකයින් ලෙස අප සතු යුතුකමක් සහ වගකීමකි. රටේ සංස්කෘතියට ගරු කරමින් ආගම දහමට ලැදිව කලාව සුපෝෂණය කරමින් යහපත් දිවියක් ගත කරන පුද්ගලයා පොසොන් පොහොයේ සැබෑ වැදගත්කම මනාව අවබෝධයක් කරගෙන ඇත්තෙකි.





Leo Randini Samaradiwakara
**Tea Technology and Value Addition Degree Program**

# අකාලික වූ බුදු දහම්

බුදුදහම අකාලික වූ දහමකි. අතීතයට, වර්තමානයට , මෙන්ම හෙට අනාගතයට ද එහි වැදගත්කම අසීමිතය. මිනිසා යනු හේතුඵල දහමේ ප්‍රතිඵලයක් බව බුදුරජාණන් වහන්සේ දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේදී වදාළ සේක. කෙසේ වුවද මිනිසා වැඩෙන සත්වයෙකි. පුද්ගල රාශියක එකතුව සමාජයක් ලෙස අර්ත දක්වන කල්හි ,සමාජයක් යහපත්ව අඛණ්ඩව ගලා යෑමට නම් යුතුකම්, වගකීම්වලට මුල් තැනක් දිය යුතුය. සමාජයේ ශක්තිමත් අරටුව යුතුකම් බව බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේදී සිඟාල ගෘහපතියාට පෙන්වා දුන් සේක.

මිනිසා යනු මනසින් උසස් වූ සත්ත්වයෙකි. යමක් සිතා බලා අවබෝධ කර ගැනීමේ ශක්තිය ඔහුට ඇත. හොඳ, නරක, කුසල් අකුසල් වටහාගැනීමට තරම් නුවණක් ඇත. එනිසා කුමන ආගමක වුවද යහපත් ආකල්ප තම ජීවිතයට ළංකරගත යුතුය. සියල්ලන්ටම මෙත් සිතින් සමසේ, ආදරය, කරුණාව, දයාව දැක්විය හැකි හදවතක් නිර්මාණය කර ගැනීම තුළින් ආදර්ශමත් විය හැකිය.

සමාජ බැඳීම් අවබෝධ කරගනිමින් නිවැරැදි ජීවන ප්‍රතිපත්තියක් ඇතිකර ගත යුතුය. හංසයා කිරි සහ ජලය වෙන් කර අදුනා ගන්නාසේ මිනිසා ද හොඳ නරක වෙන්කර හදුනා ගත යුතුය. අසත්‍යය, සත්‍යයෙන් ද, මුලාව සිහියෙන් ද, ආත්මාර්ථකාමී බව දානයෙන් ද, ද්වේශය, මෛත්‍රියෙන් ද ජයගත යුතුය. ඒ සඳහා අදාළ බෞද්ධ ආකල්ප තම ජීවිතයට උපයෝගී කර ගත යුතුය.

තෙවරක් සම්බුදු පා පහස ලද, මහින්දාගමනයෙන් ශිෂ්ට සම්පන්න වූ රටක් තුළ පියා, පුතා මරමින්, පුතා පියාට දස වද දෙමින්, ශිෂ්‍යයන් ගුරුවරුන් ගස් බැඳ තබමින්, ගුරුවරුන් ශිෂ්‍යයන් නොමඟ යවමින්, පුතාට අම්මා, තම සහෝදරිය නොපෙනෙමින් අකටයුතුකම් කරමින් පව්වු පටු අදහස් රජ කරන සමාජයක් බිහිවනුයේ යුතුකම පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසාවෙනි. කළගුණ සැලකීමද මීට. සමගාමීව සිදුකරන යහපත් සත් ක්‍රියාවකි.

"බල ලෝභීත්වයෙන් රාජ්‍යයන් අත්පත් කරගත් අශෝක රජුට ද මානසික සැනසිල්ල උදාවූයේ ශාන්ත ගමනින් වැඩිය සත් හැවිරිදි සුමන හිමියන් දැකීමෙනි. පියා ඝාතනය කර රජකම පැහැරගත් අජාසත් රජුද කුමන සැප සම්පත් වින්ද ද හදවතින් අපමණ වේදනා වින්දෙකි. ඒ අනුව වටහාගත යුතුවන්නේ මානසික සන්තුෂ්ටිය රඳා පවතිනුයේ බාහිර බලවේගයන් තුළ නොව අභ්‍යන්තර ගුණ වගාව තුළ බව්ය. සීලවන්තයා සතු මානසික සැනසිල්ල පිළිබඳව බුදුරජාණන් වහන්සේ අජාසත් රජුට සාමඤ්ඤඵල සූත්‍රයේදී කරුණු දක්වති. එම සූත්‍රයට අනුවර්ධනයට බලයට සියල්ල සිදුකළ නොහැකි බව එදා මෙන්ම නූතන මිනිසාට ද අවබෝධකරගැනීම වටී."



# EDITORIAL CREW



**EDITOR**
THARUL JAYASUNDARA

**CHIEF EDITOR**
CHALITHA ALUWIHARE

**CONTENT EDITOR**
VIHINI WATHSILUNI



**EDITORIAL CREW**
PASINDU MIHIKALPA

**EDITORIAL CREW**
SHALIKA DULANJANI

**EDITORIAL CREW**
MILASHA NINNADI

**EDITORIAL CREW**
OUSHADHI WICKRAMARATHNE

# Editer's MESSAGE





## Hello

Leo family and our esteemed readers.
This is our Leo publication for July. Stay tuned for your weekly dose of Campus Diary – The Leo Club of Uva Wellassa University monthly newsletter!
I am honored, as the Chief Editor, to ensure this is a compilation of activities and achievements of our club in the preceding month.
July has been a month of great energy Finally and commitment, with the participation in many events that closely embody the idea of serving and being with people ,defines our club. The pres ent issue of this review seeks to unveil the various initiatives that are implemented and present the efforts, commitment , put by our club. We also highlight of the site encouraging people to contribute to the website and representing the core idea of the Leo community .Unquestionably, the job of the Chief Editor is very fulfilling experience. I can appreciate the enthusiasm and innovative approach from the members and be helpful to reveal their experience and success to a broader public. It is an honor and a challenge to present and make sure the effort and the passion of our club are being present to these pages.
In going through this newsletter, I trust you will notice the level of pride and inspiration that I get. Altogether we are creating real value and I am eager to see the future.
I would also like to express my appreciation to you especially for your support and commitment.

With warm regards,

Chalitha Aluwiahre

Chief Editor
Leo Club of Uva Wellassa University



# LEO CLUB OF UWU SOCIAL MEDIA

https://uwuleos.org
Leo Club of UWU
Leo Club of Uva Wellassa University
Leo Club of Uva Wellassa University
Leo Club of Uva Wellassa University
leoclubofuwu@gmail.com

# LEO TIMES

THE OFFICIAL NEWSLETTER OF UVA WELLASSA UNIVERSITY OF SRI LANKA

VOLUME 17 | EDITION 01 | JULY 2024